දිනය :

එච්.ඒ.ඩබ්. අභයකුමාර
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා අරමුදල

**2020.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් සඳහා සටහන්

2020.12.31 ස්ථාවර තැන්පත් සහ ස්ථාවර තැන්පත් ආයෝජන පොලි -013

| ගිණුම් අංකය | මුදල | ආරම්භක දිනය | කල්පිරෙන දිනය | දින ගණන | මුදල | පොළී අනුපාතය | | පොළිය | අයකිරීම් WHT | ශුද්ධ පොළිය | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 78404430 | 7,322,732.74 | 1/1/2020 | 12/31/2020 | 366 | 7,322,732.74 | 9.83% | 1.002739726 | 721,796.75 | | 721,796.75 | |
| | | | | 0 | | 9.83% | 0 | - | - | - | - |
| 78404516 | 7,322,732.74 | 1/1/2020 | 12/31/2020 | 366 | 7,322,724.74 | 9.83% | 1.002739726 | 721,795.96 | | 721,795.96 | |
| | | | | 0 | | 9.83% | 0 | - | | - | - |
| 72785329 | | 1/1/2020 | 1/13/2020 | 13 | 9,803,528.33 | | 0.035616438 | 20,211.38 | | 20,211.38 | |
| 72987096 | | 1/1/2020 | 3/12/2020 | | 9,735,641.72 | | | 785,652.95 | | 785,652.95 | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | **14,645,465.48** | | | | | | | **2,249,457.04** | - | **2,249,457.04** | - |

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

එච්.ඒ.ඩබ්. අභයකුමාර
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

ජාතික ක්‍රීඩා අරමුදල

2020.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

2020.12.31 දිනට විවිධ ණය ගැතියෝ

| 2019 නැවත ප්‍රකාශිත<br>රු. ශත | සටහන් | කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුම් සටහන් සහ විස්තර | ගිණුම් සටහන් | 2020<br>රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| 4,212,739.95 | 04 | 013 | 000 | 00 | ස්ථාවර තැන්පත් ආයෝජන පොළි | 01.01 | 1,443,592.71 |
| | | 013 | 000 | 00 | ස්ථාවර තැන්පත් ආයෝජන පොළි 2019.12.31 දිනට | | - |
| 21,176,756.97 | 05 | 017 | 000 | 00 | ලැබිය යුතු ජාතික ලොතැරැයි මණ්ඩල ආදායම් | 14 | 16,526,292.97 |
| | 09 | 065 | 000 | 00 | ලැබිය යුතු දි.ම.රා.ක්‍රීඩාංගණයේ ආදායම අනුග්‍රාහක ලැබීම්- ආසියානු කනිෂ්ඨ මළල ක්‍රීඩා - 19/12 | | - |
| 25,389,496.92 | | | | | එකතුව | | 17,969,885.68 |

27/4/2022

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/කළමනාකාරිත්ව සහකාරී (මුදල්)
නම : එච්.එස්.ඩී. අභයකුමාර
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
දිනය :

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2020.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

### 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| 2019 රු. ශත | ගිණුමේ නම සහ විස්තරය | 2020 රු. ශත |
|---|---|---|
| | | |
| 133,843,327.01 | 2020.01.01 දිනට සමුච්චිත අරමුදල | 129,414,630.11 |
| | | |
| | | |
| (6,495,404.34) | 2020 වර්ෂයේ ඌණතාවය/අතිරික්තය | (79,788,741.99) |
| (73,132.56) | 2018 වර්ෂයේ පොලී අනුපාතිකට වැඩි අගයකට අනුව ගණනය කරන ලද පොලී ආදායම නිවැරදි කිරීම | (484,167.67) |
| 400,000.00 | පෙර වර්ෂවල විගණන ගාස්තු සඳහා අධි වෙන්කිරීම් නිවැරදි කිරීම | |
| (75,000.00) | පසුගිය වර්ෂයට අදාල අනුග්‍රාහක ලැබීම් නොලැබීම-ආසියානු කනිෂ්ඨ මළල ක්‍රීඩා -19/12 | |
| 1,814,840.00 | පෙර වර්ෂවල ලොතරැයි ආදායම භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීමේදී ඇති වෙනස ගැලපීම | |
| **129,414,630.11** | **2020.12.31 දිනට සමුච්චිත අරමුදල** | **49,141,720.45** |

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2020.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

### විවිධ තැන්පත් ගිණුම - ගි.අංක- 060

| | විස්තරය | මුදල |
|---|---|---|
| 2018.01.11 | බස/ජය කෙට්ටාව ආනන්ද මහා විද්‍යාලය දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 14 | 10,000.00 |
| 2018.01.11 | සා බෙනඩික් විද්‍යාලය-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 16 | 10,000.00 |
| 2018.01.23 | අනුලා විද්‍යාලය-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 25 | 10,000.00 |
| 2018.3.13 | ජකරාල් සර් පෙන් කෙතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය -දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 68 | 10,000.00 |
| 2018.04.10 | ඒෂියන් ග්‍රැමර් පාසල--දි.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 85 | 10,000.00 |
| 2018.06.20 | සවින්ත අනුරාධ-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 110 | 10,000.00 |
| 2018.06.12 | ලයිසියම් ජාත්‍යන්තර පාසැල-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 116 | 10,000.00 |
| 2018.07.20 | L.D.K.Rumesh-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 123 | 10,000.00 |
| 2018.09.11 | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 169 | 10,000.00 |
| 2018.09.13 | ලුවර් ජාත්‍යන්තර පාසල-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 175 | 10,000.00 |
| 2018.11.09 | ලාංකික ජවන හා පිටිය ක්‍රීඩා සමාජය -දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 228 | 10,000.00 |
| 2018.12.03 | පාසල් සංවර්ධන ගිණුම-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 256 | 10,000.00 |
| 2019.01.04 | Holly Family Convent Bambalapitiya -දි.ජා.ක්‍රි.ආරක්ෂක කැන්පතු.PIV 08 | 10,000.00 |
| 2019.01.14 | සුභාරති මහා විද්‍යාලය - දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 09 | 10,000.00 |
| 2019.03.06 | කෙ.ඩී.බටුවිට- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 42 | 10,000.00 |
| 2019.03.08 | බී.පී.ගයාන්- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 51 | 10,000.00 |
| 2019.03.11 | ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 61 | 10,000.00 |
| 2019.04.03 | සංකල්ප නදීෂ්- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 72 | 10,000.00 |
| 2019.07.09 | දිස්ත්‍රික් ලේකම් කොළඹ-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 106 | 10,000.00 |
| 2019.07.19 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුරන්ස් -දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 114 | 10,000.00 |
| 2019.07.23 | නිහාන් බාගූස් (Asian International School)- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 116 | 10,000.00 |
| 2019.07.29 | මහේෂ් තිලකරත්න -දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 123 | 10,000.00 |
| 2019.09.09 | Royal Institute International School- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 143 | 10,000.00 |
| 2019.09.09 | Royal Institute International School- දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 144 | 10,000.00 |
| 2019.09.25 | Leeds International School -දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 155 | 10,000.00 |
| 2019.10.30 | ලයිසියම් ජාත්‍යන්තර පාසල-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 179 | 10,000.00 |
| 2019.11.19 | ලූවර් ඉන්ස්ටිටූට්-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 196 | 10,000.00 |
| 2020.01.02 | එරන්ද ඉරෝෂාන් දේවනාරායන-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 01 | 10,000.00 |
| 2020.01.09 | ඩබ්.ඩබ්.ජේ.පී.විජයරත්න-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 07 | 10,000.00 |
| 2020.01.14 | ශාන්ත තෝමස් කනිටු විදුහල-දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 10 | 10,000.00 |
| 2020.01.16 | සුභාරති මහාමායා විද්‍යාලය - දි.ජා.ක්‍රි.ආරක්ෂකකැන්පතු.PIV 12 | 10,000.00 |

25/4/2021

එච්.ඒ.ඩබ්. අභයකුමාර
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| 2020.01.27 | ඩබ්.හේමන්ත-දි.ජා.ක්‍රි.ආරක්ෂකතැන්පතු.PIV 20 | 10,000.00 |
| 2020.02.06 | එච්.එද්.ඩී.එම්.ඒ.ෆැන්සිස්කා-දි.ජා.ක්‍රි.ආරක්ෂකතැන්පතු.PIV 37 | 10,000.00 |
| 2020.02.10 | සුනිමල් තෙන්නකෝන්-දි.ජා.ක්‍රි.ආරක්ෂකතැන්පතු.PIV 27 | 10,000.00 |
| | එකතුව | **340,000.00** |

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම :

දිනය : 25/4/2024

එච්.ඒ.ඩබ්. අභයකුමාර
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සටහන් අංක - 06

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2020.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

### 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවිය යුතු වියදම්

| අනු අංකය | ගෙවිය යුතු අයගේ නම | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | විගණන අධිකාරී | විගණන ගාස්තු වෙන්කිරීම | 147,000.00 |
| | එකතුව | | **147,000.00** |

31/12/2021

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

ඩබ්.ඒ.ඩබ්.
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

## 2020.12.31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොලි -013

| ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොලි - | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ගිණුම් අංකය | සිට | දක්වා | දින ගණන | පොළිය ගණනය කළ ආකාරය | | | පොළි මුදල |
| | | | | ආයෝජන මුදල | පොළි අනුපාතය | දිනක අනුපාතය | |
| 78404430 | 1/1/2020 | 12/31/2020 | 366<br>0 | 7,322,732.74 | 9.83% | 1.0027397260 | 721,796.75<br>- |
| 78404516 | 1/1/2020 | 12/31/2020 | 366<br>0 | 7,322,724.74 | 9.83% | 1.0027397260 | 721,795.96<br>- |
| | | | | | | | - |
| | | | | | | | - |
| එකතුව | | | | | | | **1,443,592.71** |

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එච්.ඒ.ඩබ්. අභයකුමාර
දිනය : ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2020.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

වැය විෂයට බැර - **066**

| මාසය | විස්තරය | මුදල රු. |
|---|---|---|
| 2021 පෙබ | ආසියානු මළල ක්‍රීඩා | 18.00 |
| 2020 මාර්තු | විවිධ | 326,040.40 |
| 2020 ජූනි | ආසියානු මළල ක්‍රීඩා | 308,750.00 |
| | මාධ්‍ය | 1,000,000.00 |
| 2020 ජූලි | ආසියානු මළල ක්‍රීඩා | 275,000.00 |
| 2020 අගෝස්තු | ආසියානු මළල ක්‍රීඩා | 5,000.00 |
| 2020 සැප්තැම්බර් | විවිධ | 15,000.00 |
| 2020 ඔක් | ආසියානු මළල ක්‍රීඩා | - |
| 2020 දෙසැ | දියගම | 4,786.00 |
| එකතුව | | **1,934,594.40** |

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

2021/02/12
එච්.ඒ.ඩබ්. අසංකකුමාර
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

| මුදල් පොත- ජාතික ක්‍රීඩා අරමුදල | | | |
|---|---|---|---|
| 2020/12/01 ඉ/ගෙ/ශේෂය | | | 96,795.04 |
| එකතුකලා-ලැබීම් | 539412 | 40,000.00 | |
| | 539414 | 5,000,000.00 | |
| | 539415 | 4,000,000.00 | |
| | 539416 | 10,000,000.00 | |
| | 539413 | 4,786.00 | 19,044,786.00 |
| | | | 19,141,581.04 |
| අඩු කලා-ගෙවීම් | | | 2,128,211.75 |
| 2020/12/31 දිනට මුදල් පොතට අනුව ශේෂය | | | 17,013,369.29 |

| බැංකු සැසඳුම -2020 -දෙසැම්බර් ගි.අංක 2323282 - ජාතික ක්‍රීඩා අරමුදල | | | |
|---|---|---|---|
| 2020/12/31 දිනට මුදල්පොත අනුව ශේෂය | | | 17,013,369.29 |
| එකතු කලා | | | |
| ඉදිරිපත් නොවූ චෙක්පත් | ඇමුණුම් 01 | 1,132,264.62 | |
| හඳුනානොගත් බැර | ඇමුණුම් 02 | - | |
| | | | 1,132,264.62 |
| | | | 18,145,633.91 |
| අඩු කලා- | | | |
| මුදල් පොතේ ඇතත් බැංකුවේ තැන්පත් නොකල මුදල් | | 14,004,786.00 | |
| හඳුනානොගත් හර | | | 14,004,786.00 |
| 2020/12/31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | 4,140,847.91 |

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

17/2/2021

එච්.ඒ.ඩබ්. අජයකුමාර්
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# National Sports Fund
## Revised Budget fot the year 2020

| Receipts | | | | | |
|---|---|---|---|---|---|
| Code | Description | Actual 2019 RS | Budget 2020 RS | Actual 9/30/2020 RS | Revised Budget 2020 RS |
| 041-000-00 | Lottery Income | 5,000,000 | 55,000,000 | 15,000,000 | 15,000,000 |
| 020-000-00 | Interest on Investments | 21,618 | 50,000 | 4,370 | 5,000 |
| 066-000-00 | Withdrawal of Invesments | 191,730,034 | 20,000,000 | 85,355,176 | 85,355,176 |
| 062-000-00 | Grants | 30,000,000 | 30,000,000 | 12,500,000 | 32,500,000 |
| 066-000-00 | Other Receipts | 612,810 | 1,000,000 | 2,732,358 | 4,000,000 |
| 065-000-00 | Diyagama Int.Sports Complex | 2,250,200 | 2,500,000 | 595,200 | 700,000 |
| 060-000-00 | Miscellaneous Deposits | 685,000 | 700,000 | 150,000 | 200,000 |
| 067-000-00 | Sponsors | 10,000,000 | 200,000,000 | | 18,000,000 |
| 068-000-00 | Donations/SLSEM | 128,400 | - | - | |
| 070-000-00 | 18th Asian Junior Athletics Championship Sponsors | 1,125,000 | 950,000 | - | |
| | Total | **241,553,061** | **310,200,000** | **116,337,104** | **155,760,176** |
| **Payments** | | | | | |
| Code | Description | Actual 2019 RS | Budget 2020 RS | Actual 9/30/2020 RS | Revised Budget 2020 RS |
| 026-000-00 | Accounting Allowances | 42,500 | 1,320,000 | 553,500 | 1,000,000 |
| 023-000-00 | Local Tournament/Events | - | 600,000 | 100,000 | 600,000 |
| 033-000-00 | Nutrition Allowances | 4,680,000 | 26,000,000 | 2,295,000 | 5,000,000 |
| 021-000-00 | International Events | 10,734,820 | 15,000,000 | 7,250,000 | 9,000,000 |
| 027-000-00 | Allowances of Temporary Basis Emp. | 600,000 | 600,000 | 423,333 | 500,000 |
| 029-000-00 | Expenditure for Media Reporters | 239,800 | 550,000 | - | 550,000 |
| 037-000-00 | Medical Expenses for Athletes | 3,073,003 | 5,000,000 | 138,690 | 1,000,000 |
| 043-000-00 | Audit Fees | 83,583 | 550,000 | 521,640 | 550,000 |
| 046-000-00 | National Sports Festival | 7,519,700 | 15,000,000 | 436,000 | 1,000,000 |
| 052-000-00 | National Sports Council | 589,200 | - | - | |
| 030-000-00 | Forign Travel - Officers | 328,565 | - | - | |
| 057-000-00 | Payments for Former Athletes | 200,000 | 350,000 | 100,000 | 400,000 |
| 040-035-00 | Sports Federations | 3,500,000 | 6,000,000 | - | 1,000,000 |
| 028-000-00 | Sports Goods for Athletes | - | 10,000,000 | 5,000,000 | 8,000,000 |
| 038-000-00 | Appreciation for Athletes | 28,099,280 | 38,280,000 | - | 1,000,000 |
| 066-000-00 | Investment Plan | 138,000,000 | - | 10,000,000 | |
| 063-001-00 | Presidential Awarding | 5,925,000 | - | - | |
| 047-000-00 | Other Expenditure | 11,931,869 | 15,000,000 | 8,433,810 | 15,000,000 |
| 065-001-00 | Diyagama Int.Sports Complex | 7,330,349 | 9,000,000 | 6,323,769 | 10,000,000 |
| 060-001-00 | Miscellaneous Deposits | 220,000 | 700,000 | 238,000 | 700,000 |
| 071-000-00 | 2019 South Asian Games | - | 100,000,000 | 93,156,417 | 100,000,000 |
| 070-000-00 | Medical Equipment | - | 32,675,000 | - | |
| 073-000-00 | Sports Insfrastructure | - | 32,675,000 | - | |
| | Total | **223,097,669** | **309,300,000** | **134,970,159** | **155,300,000** |
| | **Expected Surplus/Deficit** | 18,455,392 | 900,000 | (18,633,054) | 460,176 |

**Recommended**

Anuradha Wijekoon
Secretary,
Ministry of Youth and Sports
Date: 19/01/2021

**Approved**

Namal Rajapaksa
Minister
Ministry of Youth and Sports
Date:

# ජාතික ක්‍රීඩා අරමුදල

## ගිණුම් සංකල්ප

| | |
|---|---|
| 1 | 2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ. |
| 2 | උපචිත සංකල්පය මත ගිණුම් තබා ඇත. |
| 3 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙළ කර ඇත. |

නිවැරදි බවට සහතික කරමි

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම :

තනතුර අනුරාධ විජේකෝන්

ලේකම්

දිනය :

තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය

නො. 09, පිලිප් ගුණවර්ධන මාවත,

කොළඹ 07.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම : එච්.ඒ.ඩබ්. අභයසිරි

ප්‍රධාන ගණකාධිකාරි

දිනය : තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


| මගේ අංකය<br>எனது இல.<br>My No. | SYA/A/NSF/6/20/11 | මබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022 ජනවාරි 31 දින |
|---|---|---|---|---|---|

ලේකම්
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ක්‍රීඩා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

2021 වර්ෂයේ කොරියාවේ පැවැත්වෙන ලෝක ශූරතා මෙස පන්දු තරඟාවලියට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා මේස පන්දු සංගම්‍ය වෙත ලබාදීමට නියමිතව තිබූ රු.2,000,000 ක් කොරෝනා වසංගත තත්ත්වය මත එම තරඟාවලිය දින නියමයක් නොමැතිව කල්ගත වීම හේතුවෙන් එම මුදල ක්‍රීඩා අරමුදලට ආපසු බැර කිරීමට කටයුතු කිරීමේදී, මෙම වියදම මූල්‍ය ප්‍රකාශනවල ජාත්‍යන්තර තරඟාවලි වියදම් වලින් ඉවත් නොකර වෙක්පත අවලංගු කිරීම අනුග්‍රාහක ආදායම් ලෙස වෙනත් ආදායම් වලට ඇතුලත් කර තිබුණි. මෙම ගනුදෙනුව නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජාත්‍යන්තර තරඟාවලි වියදම රු.2,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර වෙනත් ආදායම්ද රු.2,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| *නීතිරීති/ විධානයට යොමුව* | විස්තරය |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් තුල හිමිකම් ඉල්ලුම් නොකළ රු.10,000 ක් බැගින් වූ රු 120,000.ක් අගය වූ කල් ඉකුත් වූ තැම්පතු 12 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම ,ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා බිම් මට්ටමෙන් ක්‍රීඩාව සංවර්ධනය කිරීම ආරම්භ කල යුතු බැවින් ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩාව නහා සිටුවීම අත්‍යාවශ්‍ය වන අතර ඒ අනුව ,ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩාව ඉදිරියට ගෙන යාම සඳහා දායකත්වය සපයනු ලබන සංවිධාන, පාර්ශය සහ පුද්ගලයන් වෙතද අනුග්‍රහය ලබාදීම සංගමයේ අරමුණු වුවද, ඒ සඳහා මෙතෙක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම සහ ඒ අනුව ලබා දුන් අරමුදල් ක්‍රීඩාවේ දියුණුව සඳහා ප්‍රමාණවත් පරිදි දායකත්වයක් සිදුවන්නේද යන්න නිශ්චිතව පරීක්ෂා කර බැලීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ කඹුරුපිටිය වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනයට අදාළ මුළු ඉදිකිරීම් කටයුතු සඳහා රු.9,157,993 ක්වූ ඇස්තමේන්තුගත මුළු මුදල මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. මුදල් ලබාදීමට ප්‍රථම ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තා ,ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා,ක්‍රීඩා සමාජයේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබාගෙන නොතිබුණු අතර ,වැඩ අවසන් වීමෙන් පසු ඉතිරි වූ රු.2,538,933 ක් ක්‍රීඩා අරමුදල වෙත ආපසු ලබාගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති